**දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල - 2013**

---

දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1992 අංක 09 දරන දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල් පනතේ 9(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **මතය**

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

විගණනයේදී නිරීක්ෂණය වු නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම් පහත දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| මුදල් රෙගුලාසි 751 | සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් 31 දින දක්වා මිලදීගෙන තිබූ රු.950,556 ක් වටිනා අක්ෂි කාච 72 ක් තොග පොත්වල ඇතුළත් නොකොට ආධාරලාභීන් වෙත බෙදා දී තිබුණි. |

**3.** **මූල්‍ය සමාලෝචනය**

**3.1** **මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කර ඇති මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.27,689 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 606,747 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.579,058 ක අඩුවීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ රජයේ ප්‍රදාන රු.1,000,000 කින් වැඩිවුවද, ආයතනයේ වියදම් රු.1,561,357 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

**4.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අන්ධ ජන සේවා මණ්ඩලය විසින් සති අන්තයේ එක් දිනක පමණක් පවත්වාගෙන යන පුනරුත්ථාපන ව්‍යාපෘතිය සඳහා උපදේශකවරු 6 දෙනෙකු හා අධීක්ෂණ නිලධාරියකු වෙනුවෙන් රු.544,425 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා සිසුන් 15 දෙනෙකු බඳවාගෙන තිබූ අතර ඔවුන්ගේ කුසලතා වර්ධනය සඳහා වැඩසටහන් සංවර්ධනය කර පුහුණු කරනු ලබන සිසුන් සංඛ්‍යාව වර්ධනය කර ගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා දෘශ්‍යාබාධිත ජනතා සම්මේලනය විසින් පවත්වාගෙන යනු ලබන අනුරාධපුර මහමීගස්සැගම දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ 2013 වර්ෂයේ පුද්ගලයින් 12 දෙනෙකු සඳහා රු.666,000 ක මුදලක් දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදලේ කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී අනුමත කර තිබුණි. නේවාසික පුද්ගල සංඛ්‍යාව පිළිබඳ තහවුරුවක් හෝ පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ ඒවායේ කාර්යසාධනය පිළිබඳ විස්තර ලබාගැනීමකින් තොරව ඒ සඳහා රු.374,568 ක් වියදම්කර තිබුණි.

(ඇ) 2013 වර්ෂයේ පෙබරවාරි සිට ජූනි දක්වා මාස 05 ක කාලයක් තුළදී සීදූව දෘශ්‍යාබාධිත සුභසාධන මධ්‍යස්ථානයේ කිසිදු නිෂ්පාදනයක් සිදුකර නොතිබුණි.

(ඈ) අරමුදලේ පරමාර්ථ ප්‍රමාණවත් පරිදි ඉටු කර නොගැනීම

---

1992 අංක 9 දරන දෘශ්‍යාබාධිතයන් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල් පනතේ 05 වගන්තියේ සඳහන් පහත දක්වා ඇති අරමුදලේ අරමුණු ප්‍රමාණවත් පරිදි ඉටුකරගෙන නොතිබුණි.

(i) දෘශ්‍යාබාධිතයන් සඳහා සේවා නියුක්ති අවස්ථා ඇති කිරීම සහ අවශ්‍ය අවස්ථාවන්හිදී ඔවුන්ට ස්වයං රැකියා සඳහා මූල්‍යාධාර සහ මාර්ගෝපදේශකත්වය සැපයීම ;

(ii) දෘශ්‍යාබාධිතයන්ට ශාස්ත්‍රීය පාඨමාලා හැදෑරීමට හෝ වෘත්තීය පුහුණුව ලබා ගැනීමට හැකිවනු පිණිස ඔවුන්ට නිවාස පහසුකම් සැපයීම ;

(iii) දෘශ්‍යාබාධිතයන්ගේ සුභ සාධනය පිණිස යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම ;

(iv) දෘශ්‍යාබාධිතයන් විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ සඳහා අලෙවි පහසුකම් සැපයීම.

**4.2 අරමුදල් ඌන උපයෝජනය**

---

සමාලෝචිත වර්ෂය තුළ දෘශ්‍යාබාධිතයින් 15 දෙනෙකු සඳහා රු.100,000 ක ක්‍රීඩා ආධාර ලබාදීමට ප්‍රතිපාදන තිබුණද අරමුදලෙන් කිසිදු ආධාරයක් ලබාදී නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

---

**5.1 අයවැය පාලනය**

---

අයවැය ලේඛනයේ ආදායම් වියදම් සහ තථ්‍ය ආදායම් වියදම් අතර සියයට 16 සිට සියයට 100 ක පරාසයක විචලනයන් නිරීක්ෂණය වූ බැවින් ඵලදායී මූල්‍ය පාලන ක්‍රමයක් ලෙස අයවැය ලේඛනය යොදාගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලනයන්**

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර භාර අරමුදලේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපන ව්‍යාපෘති
(ඇ) ශිෂ්‍යාධාර
(ඈ) දෘශ්‍යාබාධිත කාන්තා සුභ සාධන කටයුතු